# කළු සුදු ඉස්කෝලේ වික්‍රමය



රුසින්දු ගම්ලත්

කෘතියේ නම

කළු සුදු ඉස්කොලේ වික්‍රමය

කතෘගේ නම

රුසින්දු ගම්ලත්

කතෘගේ වෙනත් කෘති

පුංචි කොටි පැටියා

කෘතිය පළ කරන ලද දිනය

2025.02.08

ISBN 978-624-208-653-8

# පිදුම

හෙට ලොව දිනන්නට මග හසර
කියාදෙමින් මා හට මුල් අකුරු
කියා දුන්
ශාන්තා මැඩම්ට....



# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසය කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටෙම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන "භෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වයක් දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසල් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල්ම අවධියේ තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

අපේ කතාව පටන් ගන්නෙ හෙන්රි කියන පිරිමි ළමයාගෙන්. නගරේ ඉන්න හැමෝම හෙන්රිව දන්නෙ ලෝකේ ඉන්න දඟම ළමයා කියලා. හෙන්රි ගමේ තියන එක ඉස්කෝලෙකට හැර අනිත් හැම ඉස්කේලෙකටම ගිහිල්ලා තියෙනවා. ඒ හැම ඉස්කෝලෙකින්ම හෙන්රිව අස්කරලා තියෙනවා. මොකද හෙන්රි කරන දඟ වැඩ නිසා. හෙන්රි ඉස්කෝලේදී හැසිරෙනවා වගේ ම තමයි ගෙදරදිත් හැසිරෙන්නේ. එක පාරක් හෙන්රි අතට  අහුවෙන හැම දේම දාලා ඇසිඩ් එකක් වගේ දියරයක් හදලා ඒක ගෙදර තිබ්බ බිත්තියකට හැලුවා. ඊට පස්සේ හෙන්රිගේ අම්මයි තාත්තයි ගෙදර ඇවිත් බලනකොට දැක්කා ගෙදර තියන එක බිත්තියකින් හොඳටම දූම් යනවා. හෙන්රිගේ අම්මයි තාත්තයි ගෙදර ඇතුලට ඇවිත් බලනකොට එයාලා දැක්කා ඒ බිත්තිය ළඟට වෙලා හෙන්රි හිනා වෙවී ඉන්නවා. ඊට පස්සේ හෙන්රිගේ අම්මයි තාත්තයි හෙන්රිට හොඳටම බැන්නා. ඒත් හෙන්රි ඒකත් විහිළුවට ගත්තා.




අද හෙන්රි කාල යන්ත්‍රයක් හදනවා කියලා ගෙදර තියන ෆ්‍රිජ් එකයි, අවන් එකයි,බ්ලෙන්ඩර් එකයි, ටීවී එකයි සුපර්ග්ලූ වලින් එකට අලවලා  කාල තරණය කරනවා කියලා ගෙදරම කණපිට පෙරළුවා.මේ කරපු වැඩේටනම් හෙන්රිගෙ අම්මටයි, තාත්තටයි හොඳටම කේන්ති ගියා. “හෙන්රි ඔයාගේ හැසිරීම හරිම නරකයි. මමයි ඔයාගේ අම්මයි හිතුවා ඔයාව පැන්ටානා කියන ඉස්කෝලෙට දාන්න. මොකද ඒ ඉස්කෝලේ නීති හරිම සැරයි. ඒ වගේම ඒ ඉස්කෝලේ අවුරුද්ද ඉවර වෙනකම් ම ඉස්කෝලේ හොස්ටල් එකේ ඉන්න වෙනවා” කියලා

හෙන්රිගේ තාත්තා හෙන්රිට කිවුවා. හෙන්රි ඒකත් විහිළුවකට ගත්තා. “හෙන්රි ඔයා හෙටම ඒ ඉස්කෝලේට යනවා” කියලා හෙන්රිගෙ අම්මා කිව්වා. ඒකට නම් හෙන්රි ටිකක් බය වුණා. හැබැයි ටිකකින් හෙන්රිට මතක් වුණා එයාගේ හොඳම යාළුවො දෙන්නා ඒ කියන්නේ ටොමුයි ජැකුයි ඒ දෙන්නත් මීට සතියකට කලින් ඒ ඉස්කෝලෙට ගියා කියලා.

ඔන්න ඉතින් හෙට දවස උදා වුණා. හෙන්රිට නම් කිසිම බයක් නෑ අර පැන්ටානා කියන ඉස්කෝලෙට යන එක ගැන. හෙන්රිගෙ අම්මයි තාත්තයි හෙන්රිව ඒ ඉස්කෝලෙට දාලා ගියා. හෙන්රි ඉස්කෝලෙ ඇතුලට යන්න හදද්දිම එයාට පැත්තකින් කටහඬක් ඇහුණා. “හ්ම්.... මම හිතන්නෙ ඔයා තමයි හෙන්රි ඔයා දන්නෙ නැද්ද මේ ඉස්කෝලෙට පාට ඇඳුම් අඳින්න බෑ කියලා.. ඉන්නකෝ මම ඔයාට මේ ඉස්කෝලෙ කළු සුදු නිලඇඳුම දෙන්නම්.” කියලා පැත්තකින් ආපු කෙනෙක් ඇහුවා “කවුද ඔයා” කියලා හෙන්රි ඇහුවා."මම තමයි මේ ඉස්කෝලේ විදුහල්පතිතුමා.. ” කියලා ඒ කෙනා කිවූවා. “හරි දැන් මම ඔයත් එක්ක කොහෙටද යන්න ඕනෙ ඔය විකාර ඇඳුම ගන්න? ” කියලා හෙන්රි ඇහුවා. “හරි හෙන්රි ළමයා ඔයා මේ ඉස්කෝලෙට ආපු පළවෙනි දවසෙම මේ ඉස්කෝලෙ විසිවෙනි නීතිය කැඩුවා. ඒ කියන්නේ ගුරුවරයෙකුට මාස්ටර් කියලා නොකියා කතා කිරීම. ඒ වගේ ම අහපු ප්‍රශ්නෙට උත්තරේ තමයි මගේ පිටිපස්සෙන් එන්න කියන එක” කියලා විදුහල්පතිතුමා කිවූවා.



ඊට පස්සෙ හෙන්රි විදුහල්පතිතුමා කිව්වා විදිහට ම එයා පස්සෙන් ගියා. හෙන්රි ඉස්කෝලෙ ඇතුලට යද්දි හෙන්රිට කිසිම ළමයෙක් සෙල්ලම් කරනවා කියලවත්,  ළමයෙක්ගෙ සද්දයක්වත්, ළමයි අඩිය තියන සද්දයක්වත් හෙන්රිට ඇහුණේ නෑ. හෙන්රි විදුහල්පතිතුමා එක්ක ඉස්කෝලෙ ඇතුලට ගියා.

හෙන්රි දැක්කෙ කළු සුදු නිලඇඳුම් ඇඳගෙන ඉන්න ගැහැණු ළමයිනුයි පිරිමි ළමයිනුයි. එයාලා හැමෝම කොරිඩෝවල ගියෙත් පෝලිම් විදිහට.  හෙන්රි විදුහල්පතිතුමා පිටිපස්සෙන් ම ගියා.



ටික වෙලාවකින් විදුහල්පතිතුමා කාමරයක් ඇතුළට ගියා. හෙන්රිත් එයා පස්සෙන්ම ඇතුලට ගියා..ඒ කාමරය ඇතුල තනිකරම කළු සුදු පාටයි. ඒ වගේම ඒ කාමරේට තිබ්බෙත් ලොකුම යකඩ දොරක්. ඒ වගේම ඒ කාමරේ බිත්තියේ යක්ෂ මූණුවල් තියෙන මිනිස්සුගේ පින්තූර එල්ලා තිබුණා. “ආ ඔය ළමයාගේ කළු සුදු නිලඇඳුම. දැන් ඔය ඇඳුම ඇඳගෙන යනවා පන්තියට. ” කියලා විදුහල්පතිතුමා කෑගහලා කිව්වා. “මේ පින්තූර වල ඉන්න යක්කු වගේ මිනිස්සු කවුද? ” කියලා හෙන්රි විදුහල්පතිතුමාගෙන් ඇහුවා.

“ඒයි ළමයා හොඳට අහගන්නවා.. මේ ඉස්කෝලේ කලින් හිටපු විදුහල්පතිවරු, මෙයාලට ගෞරවයෙන් කතා කරනවා. ආ ඒ වගේම ගන්නවා මේ ඉස්කෝලේ නීති පොත. මේ පොතේ තියෙන නීති 150ට ම යටත් වෙලා මේ ඉස්කෝලේ ඉන්නවා. දැන් යනවා ඔය ඇඳුම ඇඳගෙන යනවා පන්තියට” කියල

විදුහල්පතිතුමා හෙන්රිට හොදටම කෑගහල හෙන්රිව කාමරෙන් එළියට ඇදලා දැම්මා ඊට පස්සෙ හෙන්රි පොත් ටිකයි නීති පොතයි අරගෙන, අර කැත කළු සුදු ඇඳුමත් ඇඳගෙන එයාගේ පන්තියට ගියා.ඒ පන්තිය ඇතුළේ ළමයි හිටියෙ හරියට රොබොලා වගේ. හැබැයි දෙන්නෙක් හැර ඒ දෙන්න තමයි හෙන්රිගේ යාළුවෝ දෙන්න හෙන්රි පන්තිය ඇතුලට ගියාම එයා දැක්කා එයාලගේ පන්තියේ ගුරුතුමිය පවා ඇඳගෙන හිටියෙ කළු සුදු ඇඳුමක් එයා පන්තිය ඇතුලට ගියාම ගුරුතුමිය එයාව අනිත් ළමයින්ට හඳුන්වල දුන්නා ඒත් හැබැයි එයාලා හෙන්රිව පිළිගත්තේ බොරු හිනාවකින් හෙන්රි ගිහිල්ල එයාගේ යාළුවෝ දෙන්නා ළග ඉඳගත්තා. ඊට පස්සේ හෙන්රිගෙ පන්තියෙ ගුරුතුමිය එයා ගැන විස්තර කිවුවා. "හරි ළමයි මේ අවුරුද්දෙ ඔයාලගේ අලුත් ටීචර් තමයි මම මගේ නම තමයි මිස් හනී" කියල පන්තිය වටේ ම බැලුවා. කිසිම ළමයෙක් කිසිම හෙලවිමක් කරන්නේ නෑ (ජැක් හා ටොම් හැර) "හේයි මමයි ටොමුයි ඔයා එනකම් තමයි හිටියේ හොඳ යටිකූට්ටු වැඩක් කරන්න අපි දෙන්න ගිය සතියෙ ප්‍රින්සිපල්ගේ කාමරේ දොර ගලවගෙන ගියා ඒත් ඒ වැඩේ අපි කරා කියලා නම් අහුවුණේ නෑ මොකද අපි ඒ දොර පාරට විසි කළා. ඔයා සිද්ධිය ගැන ගිය සතියේ ඉස්කෝලේ පත්තරෙත් ගියා. කායලා ජැක් හෙන්රිට කිවුවා. එහෙම කියනකොට තමයි හෙන්රි ආපසු පියවි ලෝකෙට ආවේ. එතකන් එයා පන්තිය වටේ බල බලා හිටියේ එතකොට ම මිස් හනී පාඩම පටන් ගත්තා. හෙන්රි පාඩම අහන් ඉන්න ගමන් හැම වෙලෙ ම බලාගෙන හිටියේ ඔරලෝසුව දිහා මොන වෙලාවෙද බෙල් එක ගහන්නෙ කියලා හෙන්රි ඔය විදිහට පැයක් විතර ඔරලෝසුව දිහා බලාගෙන ඉන්නකොට ම එක පාරටම පන්තියේ දොර දඩාහ් ගාලා ඇරුණා. ඊට පස්සෙ ලොකු කළු කබායක් ඇඳගත්ත කෙනෙක් පන්තිය ඇතුලට ආවා. මිස් හනී මම මේ පන්තියට ආවේ ජිනී කියන ගෑනු ළමයාව හම්බවෙන්න. මොකද එයා මේ වාරෙ ගණිතයට වැඩි ම ලකුණු අරගෙන තියන නිසා. එයාට අද ඉස්කෝලේ ඇරිලා මාව හම්බවෙන්න එන්න කියලා එහෙම කයලා ඒ කෙනා පන්තියෙ දොර කැඩෙන්න තරම් හයියෙන් දොර වහලා ගියා. "කවුද ඒ ආපු පිස්සා" කියලා හෙන්රි ටොම්ගෙන් ඇහුවා. "ආ ඒ තමයි මාස්ටර් ජෙෆර්සන්" කියලා ටොම් උත්තර දුන්නා. ඊට පස්සෙ පීරියඩ් එක ඉවළුයි කියලා ගහන බෙල් එක ගැහුවා.

හැබැයි පුදුමෙ කියන්නෙ කිසිම ළමයෙක් කිසි ම කලබලයක් නැතු ව තමයි කැන්ටින් එකට ගියෙ. හෙන්රියි, ජැකුයි, ටොමුයි තුන්දෙනත් ඒගොල්ලො වගෙම හෙමීට තමයි කැන්ටින් එකට ගියේ. “ඔයාට අපි කෑම කන ගමන් මේ ඉස්කෝලෙ තියන නීති ටික කියන්නම්.” කියලා ටොම් කිව්වා ඊට පස්සෙ එයාලා ඒ පාලු ඒ වගේ ම කළුවර කොරිඩෝ එක දිගේ කැන්ටින් එකට ගියා. ඒ කැන්ටින් එයක් බිත්ති තනිකරම තීන්ත ගාලා තිබුණේ කළු සුදු තීන්ත වලින් ඒ වගේ ම කැන්ටින් එකෙත් කිසිම කිසිම කතාවක් නැතුව ඔහේ කෑම ගිල ගිල ඉන්නවා. ඒ වගේ ම කැන්ටින් එකේ කෑම බල්ලෙක්ටවත් කටේ තියන්න බෑ ඊට පස්සේ මේ තුන්දෙනා මෙලෝම රහක් නැතිව සැන්විච් ටිකකුයි, නිකම් පිටි ගුලියක් වගේ තියෙන ඩෝනට් එකකුයි, හොට් චොකලට් කියලා කැන්ටින් එකේ කිසිම චොක්ලට් රහක් නැති සීතල තේ එකක් වගේ චොකලට්වුයි අරගෙන කැන්ටින් එක කොනේ තිබුණ පුංචි මේසෙක ඉඳ ගත්තා. “ඉතින් හෙන්රි ඔයා මේ ඉස්කෝලේ අර මිනිස්සු පිස්සු නීති පොත කියවලා බැලුවාද?’’ ටොම් පිටි ගුලියක් වගේ තියෙන ඩෝනට් එක කන ගමන් හෙන්රිගෙන් ඇහුවා. “තාම නම් නෑ ටොම්” කියලා හෙන්රි උත්තර දුන්නා. “මට නම් මේ ඉස්කෝලේ ගැන මොකද්දෝ සැකයක් තියෙනවා” කියලා ජැක් කිවුවා. “ඒ මොකද?’’ කියලා ටොම් වගේම හෙන්රිත් එක පාරම ඇහුවා. එතකොටම බෙල් එකත් ගැහුවා. ඊට පස්සේ තුන්දෙනාම පන්තියට ගියා.



ඊළඟට තිබුන විද්‍යාව පන්තියට උගන්නන්න ආවේ මිස් ඩිලක්. ඒ තුන්දෙනාට විද්‍යාව පන්තියේ දී කතා කරන්න පුළුවන් වුණේ නෑ. කම්මැලි පන්තිය ඉවර වෙලා යද්දි මිස් ඩිලක් හැමෝටම ඇසිඩ් වර්ගයක් ගැන වචන සීයකට වැඩි රචනාවක් ලියාගෙන එන්න කියලා. ඊළඟට තිබුණේ ඉතිහාසය පන්තිය. ඒ ඉස්කෝලේ ඉතිහාසය උගන්නන්නෙ මිස් මේ වැරැයිට්. එයත් ළමයින්ට ඕනම විෂයක් එපා කරවන විදිහට උගන්නන්න හරිම දක්ෂ කෙනෙක්. ඒ පන්තියේදීත් තුන්දෙනාට කතාකරන්න වෙලාවක් ලැබුණේ නෑ. ඉතිහාසය පන්තිය පැයක් තිබුනත් හෙන්රිට හරියට දැනුණේ දවසක්ම ගියා වගේ. ඒ පන්තියේ ඉවර වෙද්දි මිස් වැරැයිට් කිවුවා ළමයින්ට හෙට එද්දි දෙවෙනි ලෝක යුද්දේ බැටල් ඔෆ් බ්‍රිටේන් සටන ගැන වචන එකසිය විස්සකට වැඩි රචනාවක් ලියාගෙන එන්න කිව්වා. ඊට පස්සේ ඉස්කෝලෙ ඉවර වුනා. ළමයි හැමෝම හොස්ටල් එකට ගියා.ඉස්කෝලෙ අනිත් තැන් වගේමයි හොටෙල් එකත්. හොස්ටල් එකේ බිත්තිවල ගාලා තිබුණෙත් කළු සුදු තීන්ත ඊට පස්සේ ළමයි හැමෝම හොස්ටල් එකේ තම තමන්ට වෙන්වුන කාමර වලට ගියා. හෙන්රි,

ටොම්, ජැක් තුන්දෙනාම හිටියේ එකම කාමරයේ. ඒත් කාමරයේ ඇතුලට ගියාම දැක්කා ඒකෙත් බිත්ති කළු සුදු පාටයි කියලා. ඊට පස්සේ හෙන්රි එයාගේ යාළුවෝ දෙන්නයි එයාගේ කාමරේ තිබුණ පොඩි කබඩ් තුනකට එයාලගේ ඇඳුම් ටික දැම්මා. “ඊළඟට අපිට යන්න තියෙන්නේ පාඩම් කරන කාමරයට.” කාමරේ දොර අරින ගමන් ජැක් කිව්වා. “හරි එහෙනම් අපි යමු” ඉතිහාසය පොතයි, විද්‍යාව පොතයි, පැන්සල් පෙට්ටියයි අතට අරගන්න ගමන් හෙන්රි කිව්වා. ඊළඟට තුන්දෙනා පාළු කොරිඩෝව දිගේ පාඩම් කරන කාමරයට ගියා. “ජැක් ඇයි ඔයා කිව්වෙ මේ ඉස්කෝලේ ගැන ඔයාට සැකයක් තියෙනවා කියලා.” ටොම් ඇහුවේ පාඩම් කරන කාමරය ඇතුලට යද්දිමයි.



“මෙතන ගොඩක් අය ඉන්නවා. ඒක නිසා මම ඔයාලට එක නිදාගන්න යද්දි කියන්නම්.” ජැක් කිවුවෙ කොනේම තියෙන මේසෙක වාඩිවෙන ගමන් අනිත් දෙන්නත් ඒ මේසේම වාඩි වුණා. “මුලින්ම අපි මොන විෂයද කරන්නේ?’’ කියලා හෙන්රි ඇහුවා. අපි අර මිස් ඩිලක් කිව්ව අර ඇසිඩ් එක ගැන ලියමු. මම හොඳට සිට්‍රික් ඇසිඩ් එක ගැන දන්නවා. අපිට කතාවෙලා ලියන්න පුළුවන්නේ.”ජැක් උත්තර දුන්නේ විද්‍යාව පොතයි පෑනයි අතට ගන්න ගමන් ඊලඟට තුන්දෙනාම සිට්‍රික් ඇසිඩ් ගැන ඒ රචනාව ලිව්වා. ඊට පස්සේ තුන්දෙනාම දන්න විදියට වෙන් වෙන් බැටල් ඔෆ් බ්‍රිටෙන් සටන ගැන මිස් වැරයිට් දුන්න රචනාව ලිව්වා. ටිකෙන් ටික ඔහොම වැඩ කරන යද්දි කළුවර වැටුණා. තම තමන් තිබුණ වැඩ ටික ඉවර කරලා පාඩම් කරන කාමරයේ හිටපු එක්කෙනා යන්න පටන් ගත්තා හෙන්රි එයාගේ යාලුවෝ දෙන්නයි රචනාව ලියලා ඉවර කරලා පාඩම් කරන කාමරෙන් යන්න ගියා.




පාළු අඳුරු කොරිඩෝවට පුංචි එළියක් එන ලයිට් දාලා තිබුණා. ඒත් තවම කොරිඩෝවේ පාළු ඒ වගේම කළුවර ගතිය නම් වුට්ටක්වත් අඩුවෙලා නෑ. තුන්දෙනාම එයාලගේ කාමරයට ගියා. එතකොට තමයි හෙන්රි ඒ කාමරය දිහා හොඳට බැලුවේ. ඒ කාමරේ එක කොනක L හැඩයට හදපු පොඩි කුස්සියක් තිබුණා. ඒ වගේම තව පොඩි කාමරයක් වගේ තිබුණා කාමරය ඇතුලේ. “ජැක් මොකක්ද අර තියෙන පොඩි කාමරේ හෙන්රි ජැක් ගෙන් ඇහුවා. “ආ ඒ තමයි මේ කාමරේ තියෙන වොෂ්රූම් එක.” ජැක් කිව්වා එතකොට මොකක්ද අර තියෙන පොඩි කුස්සිය?’’ හෙන්රි ඇහුවා. “ඕක තියෙන්නේ අපිට කැමති නම්

තේ එකක් හදාගන්න'' ඒකට නම් උත්තර දුන්නෙ ටොම් "ආ එහෙම නම් හොඳයි අපේ අම්මා මට පොඩි ස්නැක්ස් ටිකක් දුන්නා  තව හොට් ටොක්ලට් පැකට් එකකුත් දුන්නා'' හෙන්රි කිව්වා "මම හෝදගන්න යනවා'' හෙන්රි කිවුවෙ ටවල් එකයි සබන් කැටයයි අරගෙන වොෂ්රූම් එකට යද්දිමයි.

"හෙන්රි මොකක් හින්දද දන්නෑ ජැක් කියන්නේ එයාට මේ ඉස්කෝලෙ ගැන සැකයක් තියෙනවා කියලා'' ටොම් හෙන්රිට කිව්වා. "මම දන්නේ නෑ'' හෙන්රි කිවුවා. ඊළඟ මිනිත්තු 30 ඇතුලත අනිත් දෙන්න අනිත් දෙන්නාටත් හෝදගන්න පුළුවන් වුනා. දැන් අපිට යන්න තියෙන්නේ අර ජරා කෑම තියෙන ජරා කැන්ටින් එකට හෙන්රි අනිත් දෙන්නට කිවුවා. එයාලා ඊළඟට තුන්දෙනා කැන්ටින් එකට යන ළමයි ගොඩක් අස්සේ තෙරපිලාත් රිංගලා ගිහිල්ලා අමාරුවෙන් අර ජරා කැන්ටින් එකේ උදේ කෑම කාපු මේසෙම වාඩි වුණා. එයාලට කෑමට කියලා තිබුන නිකම්ම සුදු බත් ගොඩකුයි ලුණු කියලා නාමයක් වත් ගෑවිලා නැති පොඩි චිකන් කෑල්ලකුයි නමුත් කැන්ටින් එකේ කෑම හදන මිස් ස්ටයින් කියන තඩි ඇන්ටි නම් කිවුවේ එයාලට රෑට කන්න දුන්නේ ෆයිව් ස්ටාර් හොටෙල් වල හදන විදිහට හදපු චිකන් ෆ්‍රයිඩ් රයිස් එකක් කියලා ලු.



විනාඩි විස්සක් ඇතුළත ළමයි හැමෝම කිසිම සද්දයක් නොකර අර බත්තලියයි චිකන් කෑල්ලයි කාලා ඉවර කරලා තම තමන්ගේ කාමර වලට ගියා. ඊට පස්සෙ හැමෝම නිදාගන්න යද්දිම එක පාරටම කියලා සද්දයක් ඇහුණා. "දැන් වෙලාව නවයයි දැන් අපි ඇඳට යමු" ජැක් කිවුවා. ඊළඟට ටොම් ඇඳට ගියා. අන්තිමටම ඇඳට ගියේ ජැක් ඊට පස්සේ එකපාරටම එයාලගේ ඉස්කෝලෙම

ඉස්කෝලෙ හැම කාමරේම ලයිට් ගියා. හැබැයි එක කාමරයක හැර මොකක්ද මේ එකපාරටම වුණේ? හෙන්රි ඇහුවා. හැමදාම රෑ නමයට ඉස්කෝලේ තියෙන ලොකු ඔරලෝසුව මෙන් බොංග්.. කියලා ලොකු සද්දයක් එනවා. ඊට පස්සේ ටික වෙලාව වගේ මුළු ඉස්කෝලෙම සණ අඳුරෙන් වැහෙනවා. හැබැයි එක කාමරයක හැර ඒ තමයි කාමර අංක 21837. ඉස්කෝලෙම කළුවර උනාට පස්සේ අපි හැමෝම නිදාගන්න ඕනේ දැන් ඔයාට තේරුණාද හෙන්රි ජැක්ට කිව්වා.

"ජැක් මොකද ඔයා අද උදේම කෑම කනකොට කිව්වේ ඔයාට මේ ඉස්කෝල ගැන සැකයක් තියෙනවා කියලා?". ටොම් ජැක්ගෙන් ඇහුවා. "මේක වුණේ ටික දවසකට කලින්. ඒ වෙද්දි හෙන්රි මේ ඉස්කෝලෙට ඇවිත් නෑ. ඒක වුනේ රෑ දහයට විතර. ඒ වෙද්දි ටොම් හොඳටම නිදි. මට නින්ද ගියේ නැති නිසා මම දොරේ අගුලට හැටට කට්ටක් දාලා කොහොම හරි මම දොර ඇර ගත්තා. ඊට පස්සේ මම කොරිඩෝ දිගේ ඇවිද්දා. නින්ද ගියේ නැති නිසා මම කොරිඩෝවේ එහාට මෙහාට ඇවිද්දා. එකපාරට කාගේ හරි බර අඩි සද්දයක් ආවා. මම කොරිඩෝ එකේ කොනක තිබුණ ලොකු මල් පෝච්චියක් පිටිපස්සේ හැංගුණා.



ඒ ආවේ කවුද කියලා ඔයාලා දන්නවාද? ඒ ආවේ අර කැන්ටින් එකේ කෑම හදන තඩි ඇන්ටි මිස් ස්වැයින්.එයා ආවේ අතේ පොඩි බෝතලයක් තියාගෙන එයා ආවේ හරියට මොකක් හරි හොර වැඩක් කරන්න වගේ. ඊට පස්සේ මමත් එයාගේ පස්සෙන් ගියා. මිස් ස්වැයින් කොහෙටද කියලා ඔයාලා දන්නවද?

එයාගේ කාමර අංක 21837 ට. එයා කාමරයේ ඇතුලට ගියා. නමුත් මම මට යන්න වුණේ නෑ. ඊට පස්සේ මම ආපහු කාමරයට ආවා. ඒත් මම ඒ දේ දැක්ක නිසයි මම ඔයාලට කියන්නේ මේ ඉස්කෝලේ ගැන සැකයක් තියෙනවා කියලා." ජැක් කිව්වා "ඔව් ඒ කතාව නම් ඇත්ත අනිත් එක ඇයි ඉතින් මේ ටීචර්ස්ලා හැමදාම සමහර ළමයින්ට හවසට තියාගන්නේ. අපිට මේ ගැන හොයන්නම වෙනවා. " ටොම් කිව්වා. "හේයි ටොම් ඔච්චර හදිසි වෙන්න එපා. අපි ඒක හෙමිහිට කරන්න ඕන. අපි තුන්දෙනාට විතරක් මේක තනියම කරන්න බෑ. අපිට මුලින්ම අපේ Group එකට මුළු ඉස්කෝලේම ළමයි එකතු කරගන්න ඕන. ඊට පස්සේ අපිට මේ ඉස්කෝලේ ඇතුලේ සිද්ධවෙන අපරාධය හොයාගන්න පුළුවන්.." හෙන්රි කිව්වා.

එදා රෑ තුන්දෙනාම එදා රෑ එකොළහ හමාර විතර වෙනකම් එයාලගේ කණ්ඩායමට ළමයින්ට ඇතුළත් වෙන්න කියලා පොඩි අත්පත්‍රිකා තිහක් හැදුවා. ඊට පස්සේ තුන් දෙනාම නිදාගන්න ගියා. එකපාරටම ඊයෙ රෑ ඇහුනා වගේ බොංග් බොංග් කියලා සද්දයක් ආවා. ඒකට හෙන්රියි ජැකුයි දෙන්නා උඩ විසිවෙලා ඇහැරුණා "මොකක්ද ඒ ආපහු ඇහුන සද්දේ?" හෙන්රි ඇහුවා. "හැමදාම උදේ හයටත් රෑ ගහනවා වගේම බෙල් එක ගහනවා. එතකොට හැමෝම නැගිටින්න ඕන. නමුත් ටොම් නම් කවදාවත් ඔය බෙල් එක සීය පාරක් ගැහුවත් ඒ සද්දෙට නැගිටින්නේ නෑ" ජැක් කිව්වෙ පුදුම අමාරුවකින් ටොම්ව නැගිට්ටවන්න ගමන්. එක එක පාරටම ගැස්සිලා නින්දෙන් ඇහැරුණ ටොම් එයාව මෙච්චර කලින් ඇහැරවපු එකට ජැක්ට බැන බැන ඇඳෙන් බැස්සා. හැබැයි ටික වෙලාවකින් ගියාම නම් ටොම් පියවි සිහියට ආවා.



"ඉක්මන් කරන්න හෙන්රි ඔයා මුලින්ම ගිහිල්ලා ඉක්මණට හෝදගන්න" ජැක් කිව්වා. "හරි ජැක්" හෙන්රි කිවුවෙ ටවල් එකයි දත් බුරුසුවයි අරගෙන ගියා.

ඊළඟට හෙන්රි තමන්ට පුළුවන් තරම් ඉක්මන්ට හෝදගෙන එළියට එද්දි හෙන්රි ඉස්කෝලේ කළු සුදු නිළඇඳුම ඇඳගෙන ඉස්කෝලේ බෑග් එකට පොත් ටිකයි අත්පත්‍රිකා ටිකයි දාගත්තා. අවසානයට ටොම් හෝදගන්න ගියා. ජැක් ඉස්කෝලේ නිල ඇඳුම ඇඳගද්දී හෙන්රි බෑග් එකත් අරගෙන එයාගේ ඇඳේ ඉඳගත්තා. ජැක් ඉස්කෝලේ නිළඇඳුම ඇඳ ගද්දීම ටොම් වොෂ්රූම් එකෙන් එළියට ආවා. ඊළඟ විනාඩි දහය ඇතුළත ජැකුයි,ටොමුයි දෙන්නත් ලෑස්ති වුණා. ඊට පස්සේ අද නම් කොහොම හරි එක ළමයෙක් හරි කණ්ඩායමට එකතු කරගන්නවා කියලා ලොකු විශ්වාසයකින් හෙන්රි, ටොම්, ජැක් තුන්දෙනාම පන්තියට ගියා.

අදත් වෙනද වගේම කිසිම ළමයෙක් කිසිම හෙලවීමක් නොකර රොබෝලා වගේ ඉස්සරහ තියෙන **Black Board** එක දිහා බලාගෙන හිටියා “හෙලෝ ගායිස් ඔයාලා අපේ කණ්ඩායමට එන්න කැමති නම් ඔයාලා මේ කොළ කියවලා අද හවස පහට අපේ කාමරේට එන්න. ” ටොම් ළමයින්ට අත්පත්‍රිකා බෙදන ගමන් කිවුවා. එයාලා ඉස්කෝලේ ඇරෙනකම්ම හිත හිතා හිටියේ එයාලගේ කණ්ඩායමට අද එක ළමයෙක් හරි එකතු වෙයිද කියලා. නමුත් ඉස්කෝලේ ඉවර වෙන වෙලා හවස පහට ඒ තුන්දෙනාගේ කිසිම කෙනෙක් බලාපොරොත්තු නොවුණු විදිහට කීප පාරක්ම තට්ටු කරනවා ඇහුනා. “ඔය හැමෝම අපේ කණ්ඩායමට එකතුවෙන්න කැමති අයද?” හෙන්රි දොර ඉස්සරහා හිටගෙන හිටපු ළමයින්ගෙන් ඇහුවා.



“ඔව්..” ඇවිල්ලා හිටපු හැමෝම එකවර කිව්වා. ඊළඟට ඇවිල්ලා හිටපු ළමයි හැමෝම අර පොඩි කාමරේ ඇතුලට ආවා. ඇවිල්ලා හිටපු ළමයින්ගෙන් කාමරය අතුරු සිදුරු නැතුව පිරිලා ගියා. “හරි එහෙනම් අපි මුලින්ම එක එක්කෙනා කවුද කියලා දැනගමු. ”හෙන්රි ඇවිල්ලා ඉන්න ළමයින්ට කතා කරන්න හිතට ධෛර්යය ගන්න ගමන් කිවුවා. “ඔය තුන්දෙනා ඔය කරන්න යන වැඩේ හරියන්නෑ නමුත් මම ඔයාලගේ කණ්ඩායමට එකතු වෙන්න නම් කැමතියි.” ළමයි අතරේ හිටපු කේට් කියන ගෑණු ළමයා කිව්වා. “ඔව් කේට් ගේ කතාව හරි එයා ඔයාලා වගේම ළමයි පස්දෙනෙක් ආවා. එයාලත් ඔයාලා වගේම මේ ඉස්කෝලේ ටීචර්ස්ලට පාඩමක් උගන්වන්න හැදුවා. නමුත් අන්තිමේදී එයාලගේ වැඩේ වැරදුනා ඊට පස්සේ එයාලට වුණ දේ කවුරුත් දන්නේ නෑ තාම ” එතන හිටපු මයිකල් කියන ළමයා කිව්වා.

“ඔයාල කැමති නැද්ද අපේ කණ්ඩායමට එකතු වෙන්න? කැමති අය මේ කොලේ නම් ලියලා තමන්ගේ අත්සනක් ගහන්න” ළමයින්ට කොලේකුයි පෑනකුයි අතට දෙන ගමන් ටොම් කිව්වා. ළමයි හැමෝම පෝලිමක් හැදිලා තමන්ගේ නම ලියලා අත්සන දාලා ගියා. “ඔයාලා හැමෝම යනකොට අපි මේ දෙන කොළ වලින් එහා පන්තියේ ළමයින්ටත් අපේ කණ්ඩායමට එකතු වෙන්න කියලා අත්පත්‍රිකා හදන්න. ” ඇවිල්ලා හිටපු ළමයින්ට කොලේ ගානේ බෙදෙන ගමන් ජැක් කිවුවා. ටික වෙලාවක් යනකොට කාමරේ හිටපු ළමයි එක්කෙනා එක්කෙනා අඩු වුණා. අන්තිමට ඉතුරු උනේ හෙන්රි, ටොම්, ජැක් තුන්දෙනා විතරයි. “ටොම් හෙන්රි ඔයාලා දෙන්නා ඔයාලගේ ෆෝන් ගෙනාවා නේද” හෙන්රි ඇහුවේ එයාගේ බෑග් එකෙන් ෆෝන් එකක් එළියට ගන්න ගමන් “ඔව් අපි ගෙනාවා. ඒත් මොකටද?” ටොම් හෙන්රිගෙන් ඇහුවා.



“මම දන්නවා ඇයි එයා එහෙම ඇහුවේ කියලා” ජැක් කිවුවේ එයාගේ ෆෝන් එක අතට ගන්න ගමන් “ආ හෙන්රි මටත් දැන් තේරුනා ඔයා ෆෝන් එක ගේන්න කිව්වේ කාමර අංක 21837 කාමරේ වෙන්නේ මොනවද කියලා රෙකෝඩ් කර ගන්න නේද?” ටොම් ඇහුවා. “ ඔයා හරි ටොම් ඊළඟට අපි කරන්න ඕනේ මුළු ඉස්කෝලෙම ළමයි අපේ කණ්ඩායමට එකතු කරගන්න එක. අනිත් එක අද රෑට අපිට කරන්න තියෙන්නේ කාමර අංක 21837ට ගිහිල්ලා එතන තියෙන ලොකු මල් පෝච්චිය පිටිපස්සේ අපේ ෆෝන් එක ටේප් වලින් අලවන එක” හෙන්රි කියාගෙන කියාගෙන ගියා. “ආ දැන් අපිට අර කැන්ටින් එකටත් යන්න තියෙනවා. ” ජැක් මතක් කරලා දුන්නා. එතකොටම කොරිඩෝ එකේ ළමයි ඇවිදගෙන යන සද්දයක් ආවා. “හරි එහෙනම් අපිත් යමු. ” ජැක් කිව්වා. තුන්දෙනාම පෝලිමට ගිහිල්ලා එකතු වුණා.




අදත් අර පිස්සු මිස් ස්වැයින් හදලා තිබුණේ ඊයේ හදලා තිබුන ජරා ෆ්‍රයිඩ් රයිස් එකම තමයි. ටික වෙලාවක් යනකොට කෑම එක ගිලලා දාපු ටොම් එක්කම කෑම එකෙන් පොඩ්ඩක් කාපු හෙන්රියි ජැකුයි දෙන්නත් කාමරයට ගියා. ඊළඟට එයාලා නිදන ඇඳුම් ඇඳගෙන ෆෝන් අතට අරන් දොර ළඟ ඉඳගෙන බලාගෙන හිටියා. ටික වෙලාවකින් ඊයේ ඇහුනා වගේම අර ලොකු ඔරලෝසුවෙන් බොංග් බොංග් කියලා ලොකු සද්දයක් ආවා. “ අපි තව විනාඩි පහකින් විතර කාමර අංක 21837 කාමරයේ බිත්තියේ ටේප් වලින් මගේ ෆෝන් එකේ අලවමු. ” ජැක් කිවුවා කිසිම සද්දයක් නැතුව විනාඩි පහක් ගෙවිලා ගියා. “හරි දැන් අපි යමු” ටොම්

කිවුවා හෙන්රි එයාගේ සාක්කුවෙන් හැට්ට කට්ටක් අරගෙන දොරේ යතුරු හිලට දාලා කැරකෙව්වා. එතකොටම එයාලට ඇහුනා කවුරුහරි කෙනෙකුගේ බර අඩි සද්දයක්... හෙන්රි දොරේ යතුරු හිලට ඇහැ තියලා බලනකොට එයා දැක්කා ඒ යන්නේ මේ ඉස්කෝලේ ප්‍රින්සිපල් කියලා. “හෙන්රි මාර්ගය පැහැදිලියි ද? ” ටොම් ඇහුවා . “නෑ තාම ප්‍රින්සිපල් එළියේ ඉන්නවා. ” හෙන්රි කිව්වා. ටික වෙලාවකින් ප්‍රින්සිපල් එතනින් ගියාම ටොම්, ජැක්, හෙන්රි තුන්දෙනාම කාමර අංක 21837 කාමරේ ළඟ තිබුණ මල් පෝච්චිය පිටිපස්සේ ජැක් ගේ ෆෝන් එක ටේප් වලින් අලවලා ආයෙත් කාමරයට ආවා.

අද දවසේ වුණ දේවල් නිසා මහන්සි වෙලා හිටපු දෙයක් ඇඳට වැටුන ගමන් නිදා ගත්තා. මීළඟට ආපු සති කීපය ඇතුළත හෙන්රිටයි, ජැක්ටයි,ටොම්ටයි පුළුවන් වුණා එයාලගේ කණ්ඩායමට මුළු ඉස්කෝලේම බඳවාගන්න. මුළු ඉස්කෝලේම ළමයි කණ්ඩායමට බඳවාගෙන තිබුණ පළවෙනි රැස්වීමේ ළමයි කතා වුනේ එයාලගේ ෆෝන් එක ඉස්කෝලෙට ගෙන්න ගන්න ක්‍රමයක් ගැන.




“අපිට තියෙන ලොකුම ප්‍රශ්නය තමයි අර කැලෙන් පැනපු ගෝරිල්ලෝ දෙන්නෙක් වගේ ඉන්න ලොකු ආරක්ෂිකයෝ දෙන්නා” චාලි කියන පුංචි පිරිමි ළමයා කිව්වා. “මම දන්න තරමින් නම් ඔය ආරක්ෂකයෝ දෙන්නා හරිම මෝඩයි. අපිට කරන්න තියෙන්නේ එයාලගේ අවධානය වෙන පැත්තකට ගන්න එක විතරයි” ජෙනිෆර් කියන ගෑණු ළමයා කිවුවා. ඊට පස්සේ ටික දෙනෙක් තාප්පයෙන් පැනලා තම තමන්ගේ ගෙවල්වලට ගිහිල්ලා ෆෝන් අරන් ආයෙත් ඉස්කෝලෙට එනවා. කොලින් කිවුවා. “නමුත් තව ප්‍රශ්නයක් තියෙනවා අපිට. ඒ තමයි ඉස්කෝලේ තාප්පෙ උඩ තියෙන තියුණු වීදුරු කටු ටික” ෆ්‍රෙඩ් කියලා පිරිමි ළමයෙක් කිව්වා. “ඒකට උත්තරේ මම ගාව තියෙනවා. ” ටොම් කිවුවේ එයාගේ

බැග් එකෙන් යට ස්ප්‍රින් කීපයක් තියෙන අමුතු විදිහේ සපත්තු දෙකක් එළියට ගන්න ගමන්.

"ඔය විකාර සපත්තු දෙකෙන් අපි කොහොමද අර තාප්පෙන් එහාට පැනගන්නේ " ජැනට් කියලා ගැහැණු ළමයෙක් තරහින් ඇහුවා. "මේක නිකන්ම සපත්තු දෙකක් නෙමෙයි මේකට පුළුවන් ලොකු උසක් පනින්න. මේක හැදුවෙත් අපි තුන්දෙනාම තමයි. අපේ ළඟ තව මේ වගේ දෙකක් තියෙනවා." ඒකට උත්තර දුන්නේ ජැක් එදා රෑම ළමයි හැමෝම එයාලාගේ ෆෝන් ගැනීමේ මහා මෙහෙයුම දියත් කළා. මුලින්ම හෙන්රියි, ජැකුයි,ටොමුයි කලේ එයාලගේ කාමරේ ඉඳන් ආරක්ෂකයෝ ඉන්න තැනට ටෝච් එළි ගහපු එක. මෝඩ ආරක්ෂකයෝ දෙන්නා පිස්සුවෙන් වගේ ටෝච් එළි පස්සේ පැන්නුවා. එතකොටම ළමයි තුන්දෙනෙක් උඩ පනින සපත්තු දාගෙන වැටෙන් පැන්නා. කළුවර නිසා ඒ ළමයින්ව පෙනුනේ ඉස්කෝලේ වැටෙන් පනින අවතාර තුනක් වගේ. නමුත් ඊට ටික වෙලාවකට පස්සේ ආයෙත් ඒ ළමයි තාප්පෙන් පැනලා ආවා. ඊට පස්සේ ඉස්කෝලේ එළියේ වුන කලබලය හෙන්රි යාලුවොයි නවත්තලා දැම්මා.



ඊට පස්සේ ආයෙත් ඉස්කෝලෙ තිබුන විදිහටම නිශ්ශබ්ද වුණා. වෙනදා වගේම ළමයි ඇඳට ගියා ඊළඟ දවසේ රැස්වීමට එද්දි ළමයි හැමෝම ළඟ තම තමන්ගේ ෆෝන් තිබුණා. "මට නම් තේරෙන්නේ නැහැ ඇයි අපිට මේ ඉස්කෝලේ බේරගන්න ඕන වෙන්නේ කියලා? " ලූවිස් කියන පිරිමි ළමයා ඇහුවා. " මොකද ෆෝන් එක තමයි අපේ ලොකුම ආයුධය අපිට පුළුවන් එයාලා කරන දේවල් ගැන පොලිසියට පැමිණිලි කරන්න. ඒ වගේම අපි මීට මාසයට විතර කලින් අපේ පෝන් අර කාමර අංක 21837 කාමරයේ දොර ළඟ තියෙන මල් පෝච්චිය පිටිපස්සේ "අපේ ෆෝන් වෙප්වලින් ඇලෙව්වා මේකේ එයාලා කාමර අංක 21837 ඇතුළට වෙලා කතා කරපු ඔක්කොම රෙකෝඩ් වෙලා ඇති" ටොම් කිවුවේ එයාගේ ෆෝන් එක අතට ගන්න ගමන්. ඊළඟ තමයි හැමෝම ඒ රෙකෝඩ් වෙලා තිබුන දේ ඇහුවා. ඒ රෙකෝඩ් එකේ තිබුණු විදිහට හැමෝම කතා කරේ මොකක් හරි මැෂින් එකක් ගැන. "අපි කවදාද මේ ටීචර්ස්ලා කරන හොර වැඩ පොලිසියට අල්ලලා දෙන්නේ " ඇන්ජලිනා කියන ගැනු ළමයා ඇහුවා. "අද රෑට" ජැක් කිවුවා.



ඒක ඇහුන ගමන් අනිත් හැමෝම උඩ ගිහින් බිම වැටුණා. "මොකක්ද ඔයාලගේ සැලැස්ම? " මයිකල් කියන පිරිමි ළමයා ඇහුවා. අපි අපේ සැලැස්ම පටන් ගත්තේ රෑ නමයට. ඒ හැමෝම අපේ කාමර ලොක් කරලා ගියාම අපි අපේ කාමර දොර හැට්ට කට්ටකින් අරිනවා. ඊට පස්සේ අපි ඔයාලගේ කාමරවල දොරවලුත් අරිනවා. ඊටපස්සේ ඔයාලා ෆෝන් අරගෙන අපිත් එක්ක එකතු වෙනවා. කාමර අංක 21837 කාමරේ දොර අරින්නේ තියෙන්නේ කී කාඩ් එකකින් අද පන්තියේදී මම මිස් හනීගේ කී කාඩ් එක ඉස්සුවා. ඒකෙන් අපිට කාමර අංක 21837 කාමරේ ඇතුළට යන්න පුළුවන්. ඊට පස්සේ අපිට එන ඕනම දේකට

ලෑස්ති වෙලා ඉන්න ඕනේ. ඒ වගේම අපි ලණු කෑලි කීපයකුත් ගෙනියන්න ඕන එයාලට බැඳලා දාන්න. ඊළඟට අපි පොලිසියට කතා කරලා එයාලව අල්ලලා දෙනවා. ඔන්න ඕක තමයි අපේ සැලැස්ම “ හෙන්රි කිවුවා. රැස්වීම ඉවර වුණාම ළමයි හැමෝම ආයෙත් තම තමන්ගේ කාමරවලට ගියා. ඒ හැමෝම බලාගෙන හිටියේ රෑ නමයට ගහන බෙල් එක සද්දේ ඇහෙනකම්. ටික වෙලාවකින් හැමෝම බලාගෙන හිටපු මොහොත උදාවුනා. “බොංග්.. බොංග්.. බොංග්.. ඔරලෝසුවේ සද්දේ ඇහුනා. හැම කෙනාම මහා පලායාමට සූදානම් වුණා. ටීචර්ස්ලා ඇවිල්ලා කාමර ලොක් කරලා කාමර අංක 21837 කාමරේ ඇතුළට ගියා. “හරි මෙහෙයුම පටන් ගමු. ” හෙන්රි කිවුවා.

ඊළඟට ජැක් එයාගේ හැට්ට කට්ට දාලා දොර ඇරියා. ඊට පස්සේ තුන්දෙනාම බෙදිලා ගිහිල්ලා අනිත් කාමර ඇරියා. අනිත් හැමෝමත් එයාලගේ ලොකුම ආයුධයක් අරගෙන ලෑස්තිවෙලා හිටියා. හැමෝම කාමර අංක 21837 කාමරේ ළඟට යනකොට හැමෝම බයේ ගැහි ගැහී හිටියේ මේ වැඩේ මොන වෙලාවේ මාට්ටු වෙයිද කියලා.



“මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා අපි මිස් හනීගෙන් කී කාඩ් එක ඉස්සුවා කියලා එයා දැනගනීද? ” මයිකල් කියලා පිරිමි ළමයෙක් ඇහුවා. “නෑ එයා දැනගන්නේ නෑ මොකද හැමදාම ටීචර්ස්ලා පාවිච්චි කරන්නේ එක කී කාඩ් එකක්. අද කී කාඩ් එක පාවිච්චි කරන්නේ මිස් වැරැයිටි. ඒ හින්දා අපිට කිසි ප්‍රශ්නයක් නෑ” කියලා කේටි කියන කියන ගෑණු ළමයා කිව්වා. . ඊළඟට කාමරේ අරින්නද එපාද කියලා කාටවත් හිතාගන්න බැරි වුණා. “හරි එහෙනම්

එකයි දෙකයි තුනයි මම දොර අරිනවා” කියලා ජැක් කී කාඩ් එක දාලා දොර ඇරියා.

ඇතුලේ හිටපු ටීචර්ස්ලා හැමෝම දොර දිහා පුදුමෙන් බලාගෙන හිටියා. “ඔයාලා දැම්මම අපිට යටත් වෙනවද? නැද්ද ? ” හෙන්රි අනිත් ළමයිනුයි කෑ ගහලා ටීචර්ලාගෙන් ඇහුවා. “අපි ඔයාලා වගේ පොඩි ඇටකිච්චන්ට බයවෙන්නෙ නෑ.. ” හැම කෙනෙකම බය වෙලා ඉද්දි ඉස්කොලේ විදුහල්පතිතුමා කෑගහලා කිවුවා “අපි ඕවට බය වෙන්නෑ අපිට යටත් වෙනවා.. ” ළමයි කෑ ගහලා කිවුවේ එයාලගේ ලොකුම ආයුධය වෙන ෆෝන් එක අතට ගන්න ගමන්.



“ඔය ළමයි දැම්මම අපිට යටත් වුණේ නැත්නම් අපි මේ තුවක්කු වලින් ඔයාලට වෙඩි තියෙනවා.. ” මාස්ටර් ජෝනුයි විදුහල්පතිතුමයි කෑගැහුවේ විදුලිය විදින තුවක්කු ළමයි පැත්තට දික් කරන ගමන් “අපේ කෙනෙක්ට ඕකෙන් වෙඩි තිබ්බොත් අපි දැන්ම ඒක ඉන්ස්ටර්ග්‍රෑම් එකේ ලයිව් පෙන්නනවා... ” ළමයි කිවුවේ ෆෝන් වල කැමරා ටීචර්ස්ලට දිහාට දික් කරන ගමන් “ මේ වැඩේ නම් හරියන්නෙ නෑ. ඉන්නකෝ මම ඔයාලාව විනාශ කරලා දානවා.. ” විදුහල්පතිතුමා කිව්වේ පිස්සුත් වගේ එතන තිබුන රෙද්දකින් වහලා තිබුණ දෙයක් ළඟට දුවගෙන යන ගමන් ඊට පස්සේ එයා ඒ රෙද්ද අයින් කරා.ඒ රෙද්දෙන් වහලා

තිබුණේ ලොකුම ලොකු මැෂින් එකක්. එයා ඒක තිබුණ වයර් දෙකක් එයාගේ ඔළුවට ගහගත්තා. “දැන්ම මේ ලෝකෙ ඉන්න බලවත්ම මනුස්සයා තමයි මම. අවුරුදු ගානක් ළමයින්ගේ මොළවල ශක්තිය එකතු කරලා හදපු මැෂින් එකේ වැඩ දැන් බලාගන්නවා. .. ” විදුහල්පතිතුමා පිස්සුවෙන් වගේ කෑ ගැහුවා. ටික වෙලාවක් යනකොට මැෂින් එකෙන් ටික් ටික් කියලා සද්දයක් ආවා. “මට හිතෙන්නේ එයා මැෂින් එකේ බලය ඕනවට වඩා උරා ගන්නවා කියලා. ” මිස් වැරැයිටි කිවුවා. එහෙම කියලා ටික වෙලාවකින් මැෂින් එක පිපිරිලා ගියා. ඒකෙන් කිසිම කෙනෙක්ට හානියක් නොවුනත් ඉස්කෝලේ නපුරු විදුහල්පතිතුමා මැෂින් එකේ කැඩුන කෑලි යට, යටවෙලා හිටියා. ඊළඟට මිස් ඩිලක් විදුහල්පතිතුමා ජීවත් වෙනවාද කියලා බලන්න ගියා. “මට නම් හිතෙන්නේ මෙයා දැන් ඉන්නේ කෝමා තත්ත්වයක” ගත වුන විනාඩි කිහිපයේ මිස් ඩිලක් හැරිලා බලන ගමන් කිව්වා. ඒ වෙද්දිත් ළමයි අනිත් ටීචර්ස්ලාව බැඳලා දාලත් ඉවරයි. ළමයි ටික ඩිලක්ට යටත් වෙන්න කියන්නත් කලින් එයාම යටත් වුණා.



ඊළඟට හෙන්රි පොලිසියට කතා කරා. ටික වෙලාවකින් පොලිස් නිලධාරීන් ඇවිත් ටීචර්ස්ලාව අත්අඩංගුවට ගත්තා. විදුහල්පතිතුමාව රෝහලට අරගෙන ගියා. එදා රෑ ඊට පහුවදා උදේ තමයි හෙන්රි පළවෙනි වතාවට ඉස්කෝලේ තිබුණ නීති පොත ඇල්លුවේ.



ආයෙත් මේ නීතිපොත කවදාවත් ඕන වෙන්නේ නෑ. ”කියන ගමන් හෙන්රි ඒ නීති පොත ඉස්කෝලේ තිබුණ ලෝකයේ භයානකම පිරාණා මාළු ඉන්න පොකුණට විසිකරා.

- නිමි..... –



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරනය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වර්ෂයේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාගයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවාසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපගේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය හා අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංශණ.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-653-8